# හැඳින්වීම

මිනිස් අයිතිවාසිකම් සුරැකීම පිළිබඳ ගැටලුව අද්‍යතන සමාජයේ නිතර සාකච්ඡාවට බඳුන් වන ප්‍රශ්නයකි. මිනිසා සතු අයිතිවාසිකම් හා ඒවායේ ස්වභාවය, කිසියම් සමාජයක හෝ රටක හෝ තීරණය වන්නේ එයට පසුබිම් වූ දේශපාලනික ආර්ථික, සමාජීය තතු හා අවශ්‍යතා ද, ඒ ඇසුරින් පැන නැගුණු චින්තන සම්ප්‍රදාය ද පදනම් කර ගෙන ය.

නීති විද්‍යාත්මක වශයෙන් සලකා බලන කල, මානව අයිතිවාසිකම් යනු පාලකයින් විසින් දෙනු ලබන වරප්‍රසාද හා අයිතිවාසිකම් ය. ඒ අයිතිවාසිකම්වල නීතිමය ස්වරූපය හා පැවැත්ම ආරක්ෂා කරනු ලබන්නේ ද පාලකයින් විසිනි.

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තිය අද ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන ඇත. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන් වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශ අන්තර්ගත කොට තිබේ. මින් පැහැදිලි වනුයේ අද්‍යතන සමාජ හා පුද්ගල පැවැත්ම සහතික කිරීම සඳහා අයිතිවාසිකම් පිළිබඳ ව කාල දේශානුරූප ව ගනු ලබන නිශ්චිත සම්මුති සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරනු ලබන බව ය.

අත්තනෝමතික ලෙස බලය ක්‍රියාත්මක වූ රාජාණ්ඩු පැවති පුරාතන යුගයේ, මිනිසුන්ගේ අයිතිවාසිකම් දැඩි ලෙස සීමා වූ නමුදු, ශ්‍රී ලංකාවේ ඒ සම්බන්ධයෙන් පැවතියේ විද්වතුන්ගේ අවධානයට ලක් විය යුතු තත්ත්වයකි. එකල රජතුමා රටේ අසහාය පාලකයා වුව ද, ස්වකීය බලය අත්තනෝමතික ව හෝ අසීමිත ව හෝ නො යෙදිණි. ජනතාව විෂයයෙහි අයිතිවාසිකම් ප්‍රදානය අතින් රජවරුන් මෙසේ ජනප්‍රසාදය දිනා සිටි මුත්, ඇතැම් රජවරුන් අත්තනෝමතික ලෙස ක්‍රියා කළ අවස්ථා ද අතර වාරයේ හමු වෙයි. ඒවාට තුඩු දුන් පුද්ගල අනන්‍යතා හා වෙනත් විශේෂ සාධක ද පැවතිණි. සැබැවින් ම වැඩවසම් ලක්ෂණ යුතු සමාජ ක්‍රමයක් ද, ආගමික අනුශාසකත්වයෙන් යුතු පාලන තන්ත්‍රයක් ද, සංස්ථාපිත කුලධර්මවලින් ශික්ෂිත සමාජ ක්‍රියාකාරිවයක් ද, මූලික ව අන්තර්ගත කොට ගත් සමාජ සන්දර්භයක් තුළ මේ තත්ත්වය සුවිශේෂ කොට සැළකිය යුත්තකි.

සමාජීය, ආර්ථික, සංස්කෘතික, සේවක, කාන්තා යනාදී වශයෙන් විවිධ තයින් ප්‍රභේද කළ හැකි අයිතිවාසිකම් සංකල්ප ලංකාවේ ශිලා ලේඛනවල නො මදව අන්තර්ගත ව පවති. මෙසේ වූ අයිතිවාසිකම් උල්ලංඝනය කරන අවස්ථාවල ක්‍රියාත්මක වූ දණ්ඩන ප්‍රතිපත්තියක් ද පැවතිණි. ලෝකයේ බොහෝ රටවල් විසින් මානව අයිතිවාසිකම් ලෙස මෑතක දී පිළිගෙන ඇති සංකල්ප ඈත අතීතයේ ද ශ්‍රී ලංකාවේ පිළිගැනීමට ලක් වී පැවති බව ශිලාලේඛන අධ්‍යයනයේ දී හෙළි විය. ම විසින් දර්ශනපති උපාධිය සඳහා " ලක්දිව ශිලා ලේඛනවලින් හෙළිවන මිනිස් අයිතිවාසිකම්" යන මාතෘකාව තෝරා ගන්නා ලද්දේ යථෝක්ත තතු සැලකිල්ලට ගෙන ය.

මේ පර්යේෂණයේ මූලික අරමුණ වූයේ, ක්‍රිස්තු පූර්ව තුන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ දහතුන සියවස දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ පැවති මානව අයිතිවාසිකම් සංකල්ප හඳුනා ගැනීම හා ඒවායේ ක්‍රියාත්මකභාවය පිළිබඳ විමර්ශනය කිරීම යි. එහි දී අයිතිවාසිකම් තීරණගත වීමේ දී සමාජ, ආර්ථික, දේශපාලන සාධක බල පෑ අයුරු ද අධ්‍යයනයට බඳුන් විය.

"රජු" රටේ සමස්ත ඉඩම්වල හිමිකරුය යන ආකල්පය බොහෝ විද්වතුන් අතර පැවති මතයකි. නමුත් මහජනයා විසින් ඉඩම් මිලට ගැනීම, ප්‍රදානය කිරීම හෝ අන් අයගෙන් මිල දී ගැනීම පිළිබඳ වාර්තා කරන ශිලාලේඛන මූලාශ්‍ර, උක්ත මතය තර්කයට ලක් කරන්නක් විය. එ බැවින්, අතීතයේ දී මෙ රට ඉඩම් දේපළ අයිතියේ ස්වරූපය විමසීම ද මෙහි දී පර්යේෂණයට ලක් වූ ගැටලුවකි.

වර්තමානයේ බොහෝ වාද විවාදයට ලක් වන කාන්තා හා සේවක අයිතිවාසිකම් අතීතයේ ලක්දිව ක්‍රියාත්මක වූයේ කෙසේ ද යන්න ද මෙහි දී පැන නැගුණු ගැටලුවකි. මෙකී සමාජ කණ්ඩායම් අත් පත් කර ගත් අයිතිවාසිකම් හඳුනා ගැනීම හා ඒවා හිමි කර දුන් අයුරු ද මෙහි දී අධ්‍යයනයට ලක් කෙරිණි.

මුල් මධ්‍යකාලීන යුගය වන විට මෙ රට විහාරස්ථානවල ආර්ථික පාර්ශ්වය දියුණු වූ අතර, දහවන සියවස වන විට එහි උපරිම වර්ධනයක් දැකිය හැකි ය. මෙවන් පසුබිමක් තුළ පැවිදි ජීවිතයේ ඇති වූ වෙනස්කම් ද එහි දී මතු වූ ගැටලු ද ඔවුන් මානව අයිතිවාසිකම් සංකල්ප අත්පත් කර ගත් අයුරු ද නිබන්ධයේ දී සාකච්ඡාවට ලක් විය.

අතීතයේ පැවති මානව අයිතිවාසිකම් සංකල්ප පුද්ගලයා වෙත සුරක්ෂිත කිරීමෙහි ලා අධිකරණ සංවිධානය ක්‍රියාත්මක වූ ආකාරය ද පර්යේෂණයට බඳුන් වූ ගැටලුවකි.

ප්‍රස්තුත ගැටලු අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් පාදක කර ගනු ලැබුයේ ශිලාලේඛන මූලාශ්‍ර ය. එහි දී දැනට ප්‍රසිද්ධ කර ඇති ශිලාලේඛන පමණක් පරිශීලනය කර ඇත. අදාළ පැහැදිලි කිරීම්වලට සහාය වශයෙන් සමකාලීන සාහිත්‍ය මූලාශ්‍රය ද පරිහරණය කර ඇත. කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ ඉතිහාසගත කරුණු අධ්‍යයනයේ දී පැහැදිලි හා ලිඛිත තොරතුරු අනාවරණය කරන සාක්ෂ්‍ය වශයෙන්, ශිලාලේඛන වඩා වැදගත්කමක් දරයි.